# ඩබ්ලිව්.වී.ඩී. සුදත් පුෂ්ප කුමාර එ. සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හංවැල්ල

RTIC Appeal **594/2021** - 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය සහ රීති අංක 30 ප්‍රකාරව යොමු කරන ලද ඉවත් කර ගැනීමේ අයදුම්පත්‍රය - 2022.01.03 දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලදී.

**සභාපති:** විනිසුරු උපාලි අබේරත්න
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික:** විනිසුරු රෝහිණි වල්ගම
**කොමිෂන් සභා සාමාජික:** ජොෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි

**අභියාචක** - ඩබ්ලිව්.වී.ඩී. සුදත් පුෂ්ප කුමාර
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි - සීතාවක ප්රාදේශීය ලේකම් කාර්යාලය - හංවැල්ල

**පෙනීසිටීම**
මෙය පාර්ශවයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.12.13 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලද බව දැන්වීම - 2019.12…… (දිනය සඳහන් කර නැත) තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වා නැත. |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.12.30 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | අභියාචනය ලද බව දැන්වීම - 2019.12.31 අභියාචනයට ප්‍රතිචාර දක්වා නැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2020.01.21 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2019.12.13 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*i.* *සාවද්‍ය අර්ථ ගැන්වීමක් කරමින් DSS/1/17/RTI/05/2 හා 2018.03.02 දින ලිපිය තොරතුරු පිළිබඳ කොමිෂමේ අධ්‍යක්ෂ ජෙනරාල් වරයා වෙත යොමුකර,* ***"පුවත්පත් දැන්වීම මගින් විරෝධතා හා අභියාචනා ඉදිරිපත් කරන මෙන් දැනුම් දුන් කාලය තුල එවූ විරෝධතාවයක්***

**යනුවෙන්"** වරදවා කරුණු ගෙනහැර දක්වමින් හා සඟවමින් අසත්‍ය හා දෝෂ තත්ත්වයේ තොරතුරු වාර්තා කිරීමට අදාල කරගත් "නෛතික විධිවිධාන/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

ii. ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර ඇති DSS/1/4/5 හා 2018.01.11 දින ලිපිය මගින්, **"පුවත්පත් දැන්වීම මගින් විරෝධතා හා අභියාචනා ඉදිරිපත් කරන මෙන් කල දැනුම්දීමට අනුව පෙත්සම්කරු එවූ විරෝධතාවයක් යනුවෙන්"** වරදවා කරුණු ගෙනහැර දක්වමින් හා සඟවමින් සිදුවීමට අදාල විමර්ශණ අත්හිටුවීමට ඉවහල්වූ අසත්‍ය තොරතුරු වාර්තා කිරීමට අදාල කරගත් "නෛතික විධිවිධාන/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

iii. වන්දි මුදලට එකගතාවය පළකල ලියවිල්ල ප්‍රා: ලේ: කාර්යාලයට භාරදුන් ප්‍රථම පුද්ගලයාවූ මා හට එකී ප්‍රමුඛතාවය අනුව 2016.08.04 දින පළමු වන්දි මුදල මාගේ ගිණුමට බැරවිය යුතුව තිබියදී, එදිනට පෙර විරෝධතා කිසිවක් ලැබී නොතිබියදීත් ඒ වන විට සකසා තිබූ මාගේ වවුචරයට අදාල චෙක්පත සැකසීමට "ගණකාධිකාරී" වෙත නොයවා අනීතිකව රඳවාගෙන නිවැරදි ප්‍රමුඛතාවයට පටහැනිව තෝරාගත් පුද්ගලයින් පිරිසකගේ චෙක්පත් බැංකු ගත කිරීමට අදාල කරගත් "නෛතික විධිවිධාන/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

iv. එදින වන්දි ලැබීමට අදාල සියළු සුදුසුකම් මා සපුරා තිබියදී හා වන්දි ගෙවීම් කටයුතු කඩිනම් කරන මෙන් රජය නියෝග කර තිබියදී නිවැරදි අනුපිළිවෙලට අනුව වන්දි මුදල් ප්‍රථමව ලැබිය යුතු මාගේ වවුචරය, රජයේ බලවත් නිලධාරියෙකු ලබාදුන් පුද්ගලික උපදෙසක් මත ඔහු සමග කුමන්ත්‍රණකාරීව රඳවා තබාගැනීමට අදාල කරගත්තාවූ "නෛතික විධිවිධාන/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

v. රජය අනුමත කල තක්සේරු වටිනාකම ස්වකිය නිළ බලය හා රාජකාරි සබඳතා මත අනියමින් හා රහසින් දැනගෙන මා හට එරෙහිව පැමිණිලි කිරීමට රජයේ බලවත් නිලධාරියෙකුට ඇති පහසුකමට සමාන අවස්ථාවක් එම පහසුකම නොමැති සාමාන්‍ය පුරවැසියෙකුවූ මා හට ලබනොදෙමින් නිළය/තරාතිරම සලකා දෙආකාරයේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට අදාල කරගත්තාවූ "නෛතික විධිවිධාන/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

vi. වරදක් සිදුකොට ඇති නිලධාරීන් පිළිබඳව පැමිණිලි කල පසු හෝ ඒ බව දැනගත් පසු ඒ පිලිබඳ පරීක්ෂණයක් සිදු නොකිරීමට අදාල කරගත්තාවූ "නෛතික විධිවිධාන/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

vii. වරදක් සිදුකොට ඇති නිලධාරීන් පිළිබඳව පැමිණිලි කල පසු හෝ ඒ බව දැනගත් පසු ඒ පිලිබඳ පවතින සාක්ෂි අතුරුදහන් කිරීමට හෝ සැඟවීමට හෝ පිටපත් ලබා නොදී ප්‍රමාද කිරීම සඳහා අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

viii. **ආපදාව හේතුවෙන් "ජීවත්වීමට නුසුදුසු බවට නිර්දේශ නොකලාවූ" 427/බී - පහල කොස්ගම බටහිර ග්‍රාම නිලධාරී වසමේ අංක 70 දරණ නිවසේ හිමිකරු වන ආර්.ජී.රණතුංග**

**නමැති විශ්‍රාමික ග්‍රාම නිළධාරී මහතාගේ වන්දි මුදලට එරෙහිව** 2016.08.08 දින "ප්‍රාදේශීය ලේකම්ගේ විශේෂ අවධානයට" එවා තිබූ පැමිණිල්ලක් සඳහා **"තක්සේරු නිලධාරීන් සමග ග්‍රාම නිලධාරී විසින් සිදුනොකළ/ස්ථානීය පරීක්ෂාවකින් තොර අභිරහස් තහවුරුවක්"** මත ඔහුගේ වන්දි මුදල ඒ අයුරින්ම ගෙවීමටත්, **"ජීවත්වීමට නුසුදුසු බවට නිර්දේශ නොකලාවූ"** මාගේ නිවාස පූර්ණ අළුත්වැඩියාවකට ලක්කර තිබියදී කිසිදු හානියක් නිරීක්ෂණය නොවන විටක රජයේ බලවත් නිළධාරියෙකු 2016.08.04 දින එවූ පුවත්පත් දැන්වීමට අනුකූල නොවූ පැමිණිල්ලට සාවද්‍ය අර්ථ ගැන්වීමක් සිදුකර කැඳවූ නැවත තහවුරුවක් හරහා **"තක්සේරු නිලධාරීන් සමග ග්‍රාම නිලධාරී"** සිදුකල සාවද්‍ය ස්ථානීය පරීක්ෂාවකින් පසු මුල් වටිනාකම අඩුකර ලබාදුන් වන්දි වටිනාකමක් මා හට ගෙවීමටත් අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

ix. "රජයේ මුදල් අවභාවිතයක්" පිළිබඳව යොමුකළ 2016.08.08 දින පැමිණිල්ල මා හට එරෙහි පැමිණිල්ලක් ලෙස නොසලකා හැරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

x. "රජයේ මුදල් අවභාවිතය" යටතේ රජයට හා නිලධාරීන්ට එරෙහිව එවා තිබූ 2016.08.04 දින පැමිණිල්ල නැවත තහවුරුවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට පමණක් යොමු කිරීමට පමණක් ක්‍රියාකර අදාල නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් පිලිබඳ සොයා බැලීමට අදාල අංශ වෙත පැමිණිලි නොකිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xi. වන්දි ගෙවීමට අදාලව හිමිකරුවන් තහවුරු කරගැනීමේ රජයේ අවශ්‍යතාවය සඳහා පමණක් පලකල පුවත්පත් දැන්වීමට කිසිසේත්ම අදාල නොවූ අයුරින් 2016.08.04 දින එවූ පැමිණිල්ල සඳහා දිස්ත්‍රික් ලේකම්ගෙන් උපදෙස් ලබාගැනීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xii. රජයේ කඩිනම් වන්දි ගෙවීමේ උපදෙස් අනුව නියම කල දිනයන්හිදී වන්දි මුදල් ගෙවීමට අවශ්‍යවූ සියළු සුදුසුකම් මා සපුරා තිබියදී එම කාර්යයන් නියමිත දින වනවිට ඉටුකිරීමට නොහැකිවීම ඔබ ආයතන නිලධාරීන්ගේ ගැටළුවක්ව තිබියදී, පුවත්පත් දැන්වීමට කිසිසේත්ම අදාල නොවූ හා වන්දි ගෙවීම් කාලය තුල ලද විරෝධතාවය මත වන්දි මුදල් ගෙවීම අත්හිටුවීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xiii. එම ආපදාවට අදාලව ජනතාවට කඩිනම් සහන සැලසීමේ උනන්දුව හා උවමනාව හැර, ආපදාලාභීන්ට අනුමත කල තක්සේරු මුදල පිලිබඳ ජනතාවගේ විරෝධතා කැඳවීමට රජයට හෝ දිස්ත්‍රික් ලේකම් වරයාට හෝ ප්‍රාදේශීය ලේකම් වරයාට උනන්දුවක් හෝ උවමනාවක් නොතිබියදී ප්‍රදර්ශණය නොකළ වටිනාකම්වලට එරෙහිව ලද පැමිණිලි සඳහා නැවත තහවුරු කැඳවීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xiv. පුවත්පත් දැන්වීමට අදාල නොවූ විරෝධතාවය සම්බන්ධයෙන් එවකට හිටපු ප්‍රාදේශීය ලේකම් වරයාවූ එම්.එම්.කේ.එස්. බණ්ඩාර මාපා මහතාගෙන් උපදෙස් ලබා නොගෙන

*දිස්ත්‍රික් ලේකම් තුමා වෙතින්ම උපදෙස් ලබාගැනීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xv. *2016.08.04 දින එවූ පැමිණිල්ලෙහි දිස්ත්‍රික් ලේකම් වෙතින් උපදෙස් ලබාගන්නා මෙන් සටහනක් තබා ඇතත්, එම සටහනට අනුව උපදෙස් ලැබී නොතිබියදී එවැන්නක් නැවත තහවුරුකට යොමුකිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xvi. *දිස්ත්‍රික් ලේකම් වරයාගේ උපදෙස් ලැබීමට ප්‍රථම යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ නැවත තහවුරුවක් ඉල්ලීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xvii. *දිස්ත්‍රික් ලේකම් තුමා වෙතින් ලබාදුන් උපදෙස ලේඛණගත කර නැද්ද යන්න හා එසේ ලේඛණ ගතකර නොමැතිනම් එසේ ලේඛණගත නොකිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xviii. *පැමිණිල්ල සම්බන්ධයෙන් හිටපු ප්‍රාදේශීය ලේකම් එම්.එම්.කේ.එස්. බණ්ඩාර මාපා මහතාගෙන් උපදෙස් ලබා නොගැනීමටත්, එය සෘජුවම දිස්ත්‍රික් ලේකම් වරයාට යොමු කිරීමටත් අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xix. *DSS-1-4-5 හා 2016.08.15 දින ලිපිය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකළේ දිස්ත්‍රික් ලේකම් වරයා ලබාදුන් උපදෙස් අනුවද, නැතහොත් මා විසින් 2016.08.15 දින ප්‍රාදේශීය ලේකම් වරයාට ඉදිරිපත් කල අභියාචනය සලකා බලාද යන්න*

xx. *ලැබුණු සියළු අභියාචනා හා විරෝධතා පිළිගැනීමට කටයුතු කල බවට පැහැදිලිවම දැනුම්දී තිබියදී මා විසින් 2016.08.15 දින ප්‍රාදේශීය ලේකම් වරයාට ඉදිරිපත් කල අභියාචනය පිළිබඳවද, මා හට සිදුව ඇති අසාධාරණය සම්බන්ධයෙන් රජයේ ආයතන වෙතින් ඔබ ආයතනයට යොමුකල අභියාචනා පිළිබඳවද, 2016.08.08 දින මා හට එරෙහිව ඉදිරිපත්වූ විරෝධතාවය පිළිබඳවද කිසිදු ක්‍රියාත්මකවීමක්/සලකා බැලීමක් නොකිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxi. *2016.08.08 දින මාද ඇතුළුව තවත් අයවළුන්ගේ නම් සඳහන් කර ඉදිරිපත් කර ඇති පෙර විරෝධතාවයට සමානවූ විරෝධතාවයේ,* ***"Subject ආපදා, විරෝධතා ගොනුවට යොමුකර ගෙවීම නතර කර, GA වෙතින් උපදෙස් ලබාගන්න."*** *යනුවෙන් සටහන් තබා නොතිබීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxii. *වන්දි මුදල් ගෙවීමට පෙර 2016.08.08 දින ඉදිරිපත්වූ විරෝධතාවයේ නම් සඳහන් විශ්‍රාමික හිටපු ග්‍රාම නිලධාරිගේ නිවස වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් නැවත*

*තහවුරුවක් ඉල්ලා නොසිටීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxiii. *ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සහ වසම භාර ග්‍රාම නිලධාරිවරිය සමග රාජකාරි සබඳතා/හිතවත්කම් පැවති විශ්‍රාමික ග්‍රාම නිලධාරිවරයෙකුට එක් ආකාරයකටත්, එලෙස රාජකාරි සබඳතා/හිතවත්කම් නොතිබූ මා හට වෙනත් ආකාරයකටත් වන්දි ගෙවීමේ ක්‍රමවේදය හා ආයතන ප්‍රතිපත්ති/මූලධර්ම අසමානව භාවිතා කිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxiv. *මා හට එරෙහිව නිල බලය දක්වා බලවත් රජයේ නිලධාරියෙකු 2016.08.04 දින යොමුකල පැමිණිල්ලක් හා නිල බලය රහිතව 2016.08.08 දින ලද පැමිණිල්ලක් අතුරින් බලවත් රජයේ නිලධාරියා එවූ 2016.08.04 දින පැමිණිල්ල පමණක් පදනම් කරගෙන නැවත තහවුරුවක් කැඳවීමට හා නිල බලය රහිතව 2016.08.08 දින ලද පැමිණිල්ල නොසලකා හැරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxv. *සිදුවීමට අදාල නොවූ වෙනත් රජයේ නිලධාරියෙකුගේ උපදෙසක්/සැලසුමක් මත, පුවත්පත් දැන්වීමෙන් කැඳවූ විරෝධතාවයට, කිසිසේත්ම අදාල නොවූ* ***විරෝධතාවයක් සාවද්‍යව යොදවා ගැනීම*** *සඳහා අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxvi. *තොරතුරු සැපයීමට නිත්‍යානුකූලව බැඳී සිටින අයෙකු වශයෙන් අසත්‍ය බව දන්නාවූ තොරතුරු සත්‍ය තොරතුරු ලෙස සැපයීමට, අසත්‍ය ප්‍රකාශ සිදුකිරීමට හා බොරු සාක්ෂි සැකසීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxvii. *මා හට එරෙහිව නිල බලය දක්වා බලවත් රජයේ නිලධාරියා විසින් 2016.08.04 දින යොමුකල පැමිණිල්ල හා නිල බලය රහිතව 2016.08.08 දින ලද පැමිණිල්ලක් අතුරින් බලවත් රජයේ නිලධාරියා එවූ 2016.08.04 දින පැමිණිල්ලට* ***"Subject ආපදා, විරෝධතා ගොනුවට යොමුකර ගෙවීම නතර කර, GA වෙතින් උපදෙස් ලබාගන්න."*** *යනුවෙන් සටහනක් තැබීමට හා නිල බලය රහිතව එවූ පැමිණිල්ලට එවැනි සටහනක් නොතබා සමාන කරුණු සම්බන්ධයෙන් දෙආකාරයෙන් ක්‍රියාත්මකවීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxviii. *පුද්ගල නිල බලය/තත්ත්වය/හිතවත්කම් හා රාජ්‍ය සේවයේ පැවති සබඳතා සලකා* ***"ස්වකීය නිල බලය"*** *අනිසි ලෙස හා පක්ෂග්‍රාහීව/අසාමාන්‍යව/අනීතිකවද භාවිතා කිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xxix. *වෘත්තීයමය පළපුරුදුකම් සහිත නිලධාරීන්ගේ ඇස්තමේන්තු කිරීම් වලට එරෙහිව ලද පැමිණිලි වල සඳහන් නිලධාරීන්ගේ අයථා ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශණ/පරීක්ෂණ සිදුකිරීම සඳහා අදාල බලධාරීන්/පාර්ශවයන් වෙත එම පැමිණිලි යොමු නොකිරීමටත්, එහි*

*වරද හා අගතිය වින්දිතයා වෙත පැවරීමටත් අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකුල වේද/නොවේද යන්න*

xxx. *වන්දි ගෙවීමට පෙර "රජයේ මුදල් අවභාවිතය" යන කරුණ යටතේ ලද සමහරක්ගේ විරෝධතා නොසලකා බැලීමටත්, ලැබුණු විරෝධතා සලකා ඒ වනවිට නොගෙවන ලද සියළු වන්දි මුදල් අත්හිටුවා ඉතිරි වන්දි ලාභීන්ගේ තක්සේරු වටිනාකම් තහවුරු කරගෙන පමණක් ගෙවීමට හැකියාව පැවතියදී එසේ "රජයේ මුදල් අවභාවිතය" පිළිබඳ පොදුවේ අවධානය යොමුනොකර ජනතාවගේ පැමිණිලි මත පුද්ගලයින් ඉලක්ක කරගෙන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකුල වේද/නොවේද යන්න*

xxxi. *පළමු තක්සේරු ගොනුවේ මුල් සටහන් වෙනස්කර/විකෘතිකර සාවද්‍ය හා අවිධිමත් කරුණු 28 ක් පමණ ඇතුලත් කර තක්සේරු නිලධාරීන් සැකසු වංචනික හා කූඨ තක්සේරු ලේඛණයේ සඳහන් නිරීක්ෂණය නොවූ හානි හා සිදුනොවූ හානි "පරික්ෂා කල බවට" හෝ එම වාර්තාවට එකඟවන බවට සාවද්‍යව අත්සන් තැබීමට වසම භාර ග්‍රාම නිලධාරී විසින් අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකුල වේද/නොවේද යන්න*

xxxii. *එම නැවත පරික්ෂාවේදී මාගේ නිවාස **"ජීවත්වීමට නුසුදුසු එකක්"** බවට නිර්දේශ කර ඇති බව හෝ **"එය පුද්ගලික වියදමින් ප්‍රතිසංස්කරණය කර ඇති බවට"** තක්සේරු නිලධාරීන්ට මගපෙන්වීමක් නොකර කරුණු වරදවා ගෙනහැර පාමින් සාවද්‍ය හානි පරික්ෂා කල බවට සාවද්‍ය දිනයක් යටතේ අත්සන් තැබීමට වසම භාර ග්‍රාම නිලධාරී විසින් කටයුතු කර ඇත්නම් ඊට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකුල වේද/නොවේද යන්න*

xxxiii. *නැවත පරික්ෂාව සිදුකල බව දක්වන 2016.09.15 දින පරික්ෂාවට **කේ.කේ.එල්.රාජකරුණා මහතා සමග සහභාගී** නොවී හා වෙනත් නිලධාරීන් පිරිසක් සමග සිදුකල පරික්ෂාවකට අදාල දිනයක් යොදා, සාවද්‍ය දිනයක් යටතේ එම වංචනික වාර්තාව **"පරික්ෂා කල බවට" අත්සන් තබා බලධාරීන්ට** අසත්‍ය තොරතුරු සැපයීමට හා බොරු සාක්ෂි දීමට ග්‍රාම නිලධාරිට අවස්ථාවක් සැලසෙන ආකාරයේ "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකුල වේද/නොවේද යන්න*

xxxiv. *එක් පැමිණිල්ලක් මත ක්‍රියාත්මකවුවද, **"පැමිණිලි"** ගණනාවක් ලැබුණු ලෙස වැරදි ආකල්පයක් ඇතිවනසේ DSS/1/4/5 හා 2016.08.15 දිනැති ලිපිය තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකිරීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකුල වේද/නොවේද යන්න*

xxxv. ***"ජීවත්වීමට නුසුදුසු බවට නිර්දේශිත"** මාගේ නිවස සඳහා **"පළමු වටයේදී රු:50000/= ක දීමනාව හිමිගැන්වීමට** අදාල නිර්දේශ ඇතුලත් **"නිවස පිරික්ෂීම් වාර්තාවේ පිටපත",** මාගේ පළමු වන්දි මුදලවූ රු:853000.00 ක මුදලට මා එකඟතාවය පලකල ලිපිය හා ඊට අදාලව සැකසු වවුචරයද, 2016.08.15 දින මාගේ අභියාචනක්ද කාර්යාල ගොනුවලින් අස්ථාන ගතකිරීමට හෝ අතුරුදන් කිරීමට හෝ සැඟවීමට හෝ ගොනුවෙන් ගලවා ඉවත් කිරීමට හෝ පිටපත් ලබානොදී කරුණු වසන් කිරීමට හෝ අදාල කරගත් "නෛතික*

විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xxxvi. 2016.08.15 දින ප්‍රාදේශීය ලේකම් වෙත මා යොමුකළ අභියාචනයක් ගොනුවෙන් අතුරුදහන්වීම පිළිබඳව යොමුකළ පැමිණිලි පිළිබඳව සොයා නොබැලීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xxxvii. ගොනුවෙන් අතුරුදහන්කර තිබූ 2016.08.15 දිනැති එම අභියාචනය 2017.04.18 දින මාගේ ලිපියක් සමග අමුණා තිබියදී හමුවූ බවට අසත්‍ය කරුණු දැක්වීමක් සම්බන්ධයෙන් විධිමත් සොයා බැලීමක් සිදු නොකර සිටීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xxxviii. වසම භාර ග්‍රාම නිලධාරිගේ අයථා ක්‍රියා සම්බන්ධයෙන් මා යොමුකළ පැමිණිල්ල මත ඔබ ආයතනයේ පවතී විභාග කිරීමේදී මා වෙතින් හා ග්‍රාම නිලධාරී වෙතින් ලබාගත් ප්‍රකාශය හා එහිදී හෙළිවූ වැදගත් කරුණු/දෝෂ තත්ත්වයන්/අයථා ක්‍රියා/අසාමාන්‍ය තත්ත්වයන් පිළිබඳව මා වෙත හෙළි නොකර සිටීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xxxix. දිගු කලක් ප්‍රමාද කරමින් අනීතිකව රඳවාගෙන සිටි මා හට එරෙහි පැමිණිල්ල සම්බන්ධයෙන්, 2016.08.15 දින මා අභියාචනය යොමුකළ පසු පමණක් කඩිනමින් ක්‍රියාත්මකව නැවත තහවුරුවක් ඉල්ලීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xl. අනුමත වන්දි මුදලට එකඟ නොවූ ආපදා ලාභීන් සඳහා ලබාදුන් **"අභියාචනා කාලය"** මා හට අහිමි වනසේ, විරෝධතාවය සම්බන්ධයෙන් තහවුරුවක් ඉල්ලීම හිතාමතා පමාකර ඇති වුවද රජයේ බලවත් නිලධාරියෙකුගේ පෙත්සම ලද විගස වන්දි අත්හිටවීමටත්,මාගේ අභියාචනය යොමුකරන තෙක්ම එය නැවත තහවුරුවකට නොයවා අනීතිකව රඳවා ගෙන සිටීමටත් අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xli. සිදුවීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය ඇතුළු රාජ්‍ය ආයතන කීපයක් වෙතින් යොමුකළ ලිපි ගණනාවක උපදෙස් අනුව ක්‍රියාත්මක නොවී සිටීමට හා ඒ පිළිබඳව මා වෙත කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xlii. වන්දි මුදල් බැංකු ගත කල 2016.08.04 දින සිට 2016.08.15 දින දක්වා වන්දි මුදල් ගිණුමට බැර නොවීම පිළිබඳව අවස්ථා ගණනාවක් පැමිණ විමසීමේදී, මාගේ වන්දි මුදල් අත්හිටුවා ඇති බවක් මා හට නොදන්වා, "හෙට" මුදල් බැරකරන බව දන්වමින් මා රැවටීමට හා නොමග යැවීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න

xliii. *වන්දි මුදල සංශෝධනය කිරීම මාගේ අභියාචනය අනුව සිදුකල එකක් බව දන්වා සාවද්‍ය දිනයක් යටතේ සාවද්‍ය ලේඛනයක් මා වෙත ලබාදීම වංචනික අරමුණින් කල එකක් බව නිරීක්ෂණයවේ. එවන් සංශෝධිතයක් දැන්වීමට ආකෘති පතක් හෝ ක්‍රමවේදය තුල පිළියෙළ කර නොතිබියදී එවැනි සාවද්‍ය ලේඛණයක් සකසා මා වෙත ලබාදීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xliv. *නිලධාරියෙකු විසින් ස්වකීය නිල බලය යෙදවීම හේතුවෙන් නැවත පරීක්ෂාවකින් පසු වන්දි මුදල් අඩුවීමක් සිදුවූයේ මාගේ තක්සේරුව සඳහා පමණක් බැවින්, එම නිල බලය මත වන්දි ගෙවීම් ක්‍රමවේදය මා වෙනුවෙන් අසමානව ක්‍රියාවට නැංවීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xlv. *හානියට පත්වූ නිවස මාගේ පුද්ගලික වියදමින් ප්‍රතිසංස්කරණය කර තිබියදී එහි මුල් හානි හෝ සුන්බුන් කිසිවක් නොදැක හා මැන, පරීක්ෂා නොකර සිදුකල සාවද්‍ය නැවත පරීක්ෂාවකින් පසු ඊට අදාල තක්සේරු ගොනුවේ මුල් සටහන් වංචනිකව හා කූඨ ලෙස වෙනස්කර/විකෘතිකර ග්‍රාම නිලධාරිගේද අත්සන් සහිතව තක්සේරු නිලධාරීන් සැකසූ සාවද්‍ය වාර්තාව මගින් එකී වන්දි මුදල කප්පාදු කිරීම පිළිබඳව හා ඊට මූලිකවූ නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව නිරීක්ෂණය කිරීම/සොයා බැලීම සඳහා අදාල නිලධාරීන් සමගින් මාගේ නිවසට පැමිණෙන මෙන් 2019.05.17/2019.06.27 දින ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව කල දැනුම්දීම් වලට අනුව ක්‍රියාත්මක නොවීමට අදාල කරගත් "නෛතික විධිවිධානයන්/ප්‍රතිපාදන" මොනවාද යන්න හෝ එවැනි ක්‍රියා අනුමත පටිපාටීන්ට අනුකූල වේද/නොවේද යන්න*

xlvi. *අංක i සිට xlv දක්වා ඉල්ලූ තොරතුරු වලට අදාලව **"එවැනි ක්‍රියාවක්/ක්‍රියා සිදුව නොමැති බවට"** දක්වන්නේනම් එවැනි ක්‍රියා පිළිබඳව විධිමත් සාක්ෂි සහිතව ඔප්පු කිරීමට/පැමිණිලි කිරීමට මා වෙත ලබාදෙන අවස්ථාව කුමක්ද යන්න හා ඒ සඳහා ඔබ ආයතනයට පැමිණියයුතු දිනය/වේලාව හා මුණගැසිය යුතු බලධාරියා කවුද යන්න පිළිබඳව තොරතුරු ලබාදෙන්න*

තොරතුරු නිලධාරියා පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2019.12.30 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. නම්කළ නිලධාරියාද පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2020.01.21 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

2021.12.30 දිනැති විද්‍යුත් ලිපිය (Email) මගින්, තම අභියාචනය ඉවත් කර ගැනීමට තීරණය කර ඇති බවට, අභියාචක කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

> *"1. පොදු අධිකාරියවූ සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව මා විසින් ඔබ කොමිසම වෙත යොමුකල ශීර්ෂයේ සඳහන් තොරතුරු අභියාචනය ඇතුළුව 2020.06.07 දින දක්වා යොමුකල සියළු තොරතුරු අභියාචනා අවලංගු කරමින්ද, ඒ සියළු තොරතුරු අභියාචනා අතුරින් මා වෙත නොලද තොරතුරු පමණක් ඇතුලත් කරමින්ද, නව තොරතුරු අභියාචනයක්*

*2021.10.01 දින මා විසින් ඔබ කොමිසම වෙත යොමුකරන ලද අතර, RTIC Appeal/311/2021 දරණ තොරතුරු අභියාචනයද විභාගයට ගැනීමට පෙර සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් මා හට සෑහීමකට පත්විය හැකි පරිදි තොරතුරු ලබාදීම හේතුවෙන් එයද මාගේ ස්වකැමැත්තෙන් ඉල්ලා අස්කර ගත් බව 2021.04.27 දිනැති මාගේ ලිපියෙන් ඔබ කොමිසම වෙත දැනුම්දෙන ලදී.*

*2. ඒ අනුව යොමු ලිපියෙන් දන්වා ඇති අංක RTIC Appeal/594/2021 දරණ තොරතුරු අභියාචනයද එමගින් අවලංගු වන බවත්, එයද මාගේ කැමැත්තෙන් ඉල්ලා අස්කරගත් එකක් බවටත් නැවතත් ඔබ වෙත තහවුරු කරමි."*

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 30(1) පහත පරිදි වේ.

"අභියාචනයක් විභාග වෙමින් පවතින විට අභියාචකට ඕනෑම අවස්ථාවකදී කොමිෂන් සභාව වෙත ලිඛිතව හේතු දක්වා, ඔහු/ඇය විසින්ම අත්සන් කර, අනෙක් පාර්ශවය/න් වෙත ලබාදීම සඳහා පිටපතක් ද සමග ඉදිරිපත් කිරීම මගින් සිය අභියාචනය ඉවත් කර ගැනීමට හැකි අතර, කොමිෂන් සභාව අනතුරුව සියලූ පාර්ශවයන්ට මෙකී අභියාචනය ඉවත් කර ගැනීම පිළිබඳ දැනුම්දීම ලබාදෙනු ඇත."

රීති අංක 30(3) පහත පරිදි වේ.

"ඉහත උප රීති (1) සහ (2) හි සඳහන් කරන හේතු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තෘප්ත වේ නම්, අභියාචනය ඉවත් කර ගැනීමට ඉඩ දෙනු ඇත."

2017 තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභා රීතීන් හි, රීති අංක 30(3) ප්‍රකාරව, ලබාදී ඇති හේතුන් වලින් කොමිෂන් සභාව සෑහීමකට පත්වී ඇති බැවින් අභියාචනය ඉවත් කර ගැනීමට අවසර දෙනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

..............................................................
විනිසුරු උපාලි අබේරත්න - සභාපති

...............................................................
ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමිෂන් සභා සාමාජික

..............................................................
විනිසුරු රෝහිණී වල්ගම - කොමිෂන් සභා සාමාජික

..............................................................

**ජ්යෙෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමිෂන් සභා සාමාජික**